# සුබෝ බුද්ධානං උප්පාදෝ - බුදු උපත සැපදායකයි

## 2564 වන වෙසක් සැමරුම

අනුලා විද්‍යාලයිය බෝසත් දියණිවරුණි ,

අසිරිමත් බුදු තෙමඟුල සමරන උතුම් වෙසක් පොහො දින සිදුහත් බෝසත් උපත, සිදුහත් බෝසතානන් වහන්සේ බුද්ධත්වයට පැමිණීම බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම යන මූලික කරුණු හා තවත් වැදගත් කරුණු රැසක් සිදු වී ඇත.

ඒ අතර

- බුද්ධත්වයෙන් පසු බුදුරජානන් වහන්සේ කිඹුල්වත්පුරට වැඩමවීම හා යමා මහ පෙළහර පෑම
- බුදුරජාණන් වහන්සේගේ 3වන ලංකාගමනය වූ කැළණියට වැඩම කරවීම හා එදිනම සමනල සිරි පා සටහන තැබීම
- විජය කුමරු ලංකාවට පැමිණීම හා සිංහල ජාතියේ ආරම්භය ඇති වීම
- දෙවනපෑතිස්ස රජු ධර්මාශෝක රජුගේ නියමයෙන් දෙවනවර අභිෂේක ලැබීම
- දුටු ගැමුණු රජු රුවන්වැලි සෑයේ වැඩ ඇරඹීම
- ධර්ම භාණ්ඩාගාරික ආනන්ද මහ රහතුන් වහන්සේ පිරිනිවන් පෑ ම

යන ඓතිහාසික සිද්ධීන් වේ. මෙවර ජාතික වෙසක් මංගල්‍යයේ තේමාව " **ආරෝග්‍යා පරමා ලාභා සන්තුට්ඨී පරමං ධනං**" යන්නයි

ඉහත ඓතිහාසික සිද්ධියක් හෝ තේමාව පදනම් කරගෙන ලොව පහල වූ අසහාය නායක සම්මා සම්බුදු රජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව , ගෞරවය පෙරදැරි කරගෙන පංචශීල ප්‍රතිපත්තියේ පිහිටා නිවසේ සිට වෙසක් සැමරීම සිදු කරන මේ අවස්ථාවේ ඔබගේ නිදහස් අදහස් පදනම් කරගෙන සිදු කරන ස්වයං නිර්මාණ පාසල් වෙබ් අඩවියේ ප්‍රදර්ශන කිරීමට අවස්ථාව උදා වී ඇත.

නිර්මාණ යොමු කිරීමේදී පහත කරුණු පිලිබඳ සැලකිලිමත් වන්න

- ඔබගේ නිර්මාණ ගද්‍ය , පද්‍ය , නිසදැස් , චිත්‍ර හෝ වෙසක් සුභ පැතුම් පතක් විය හැක
- නිර්මාණ අංශ 4ක් යටතේ යොමු කල හැකිය

  ප්‍රාථමික අංශය - 1ශ්‍රේණිය සිට 5 ශ්‍රේණිය දක්වා

  කණිෂ්ඨ අංශය – 6 ශ්‍රේණිය සිට 8ශ්‍රේණිය දක්වා

  අන්තර් මධ්‍යම අංශය - 9 ශ්‍රේණිය සිට 11ශ්‍රේණිය දක්වා

  ජ්‍යෙෂ්ඨ අංශය - 12 හා 13 ශ්‍රේණි

- **ගද්‍ය**

  ප්‍රාථමික අංශය වචන 75ක්

  කණිෂ්ඨ අංශය වචන 150ක්

  අන්තර් මධ්‍යම අංශය වචන 200ක්

  ජ්‍යෙෂ්ඨ අංශය වචන 250ක්

- **පද්‍ය**

  ප්‍රාථමික අංශය පැදි 1ක් හෝ 2ක්

  කණිෂ්ඨ අංශය පැදි 3ක්

  අන්තර් මධ්‍යම අංශය පැදි 4ක්

  ජ්‍යෙෂ්ඨ අංශය පැදි 4ක්

- **නිසදැස්**

  ප්‍රාථමික අංශය පේලි 6ක්

  කණිෂ්ඨ අංශය පේලි 10ක්

  අන්තර් මධ්‍යම අංශය පේලි 12ක්

  ජ්‍යෙෂ්ඨ අංශය පේලි 16ක්

- **චිත්‍ර** ( ඕනෑම මාධ්‍යයක් භාවිතා කල හැකියි)

  ප්‍රාථමික අංශය A4 ප්‍රමාණය

  කණිෂ්ඨ අංශය A4 ප්‍රමාණය

  අන්තර් මධ්‍යම අංශය A3ප්‍රමාණය

  ජ්‍යෙෂ්ඨ අංශය A3ප්‍රමාණය

- **වෙසක් සුභ පැතුම් පතක්**

| | | |
|---|---|---|
| ප්‍රාථමික අංශය | 3" x 4" | ප්‍රමාණය |
| කණිෂ්ඨ අංශය | 3" x 5" | ප්‍රමාණය |
| අන්තර් මධ්‍යම අංශය | 4" x 5" | ප්‍රමාණය |
| ජ්‍යේෂ්ඨ අංශය | 4" x 5" | ප්‍රමාණය |

( ඕනෑම මාධ්‍යයක් භාවිතා කල හැකියි - සුභ පැතුම්පතෙහි දෙපැත්තම යොමු කල යුතුයි)

**සැ . යු**

ඔබගේ නිර්මාණ 2020.05.05 දින සිට 2020.05.07 දින දක්වා එවිය හැකියි.

නිර්මාණ යොමු කල යුත්තේ anulavidyalaya2017@gmail.com යන e-mail ලිපිනයටයි .

නිර්මාණ ඉදිරිපත් කිරිමේදී ඔබේ සම්පූර්ණ නම , පන්තිය හා අංශය සදහන් කළයුතුයි.

- බෞද්ධ සංගමය -